**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සේවා පළපුරුද්ද හා කුසලතාව නිර්ණය කිරීමේ ලකුණු පරිපාටිය අදාළ කර ගත යුතු පොදු නිර්ණායක**

| ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර | | උපරිම ලකුණු |
|---|---|---|
| **01.** **ජ්‍යෙෂ්ඨත්වය**<br>සුදුසුකම් සැපිරූ කාලයට පසු I ශ්‍රේණියේ වසරක සේවා කාලයට ලකුණු 05 බැගින් වසර 10කට | | 50 |
| **02.** **කුසලතාවය**<br>2.1. කාර්ය සාධනය (ආසන්න වසර 05 සඳහා)<br>- ඉතා හොඳයි<br>- හොඳයි<br>- සතුටුදායකයි<br>(වසරකට ලකුණු 03 බැගින් වසර පහක් සඳහා ප්‍රදානය කරනු ලබන උපරිම ලකුණු 15) | <br><br>ලකුණු 03<br>ලකුණු 02<br>ලකුණු 01 | 15 |
| 2.2. පරිගණක සාක්ෂරතාවය/ පුහුණුව<br>2.2.1. මාස 06කට නොඅඩු පාඨමාලා කාලයක් සහිත රජයේ පිළිගත් ආයතනයකින් ලබා ගත් පරිගණක ඩිප්ලෝමාවක් සාර්ථකව නිම කිරීම<br>2.2.2 මාස 03කට නොඅඩු පාඨමාලා කාලයක් සහිත රජය පිළිගත් ආයතනයකින් ලබා ගත් සහතික පත්‍ර පාඨමාලාවක් සාර්ථකව නිම කිරීම<br>(එක් ඩිප්ලෝමාවකට හෝ එක් සහතික පත්‍රයකට පමණක් සීමා වන පරිදි උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.) | <br>ලකුණු 03<br><br>ලකුණු 01 | 03 |
| 2.3. ඉංග්‍රීසි දැනුම<br>2.3.1. රජයේ පිළිගත් ආයතනයකින් ලබා ගත් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමාවක් සාර්ථකව නිම කිරීම<br>2.3.2. රජයේ පිළිගත් ආයතනයකින් ලබා ගත් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සාර්ථකව නිම කිරීම<br>(එක් ඩිප්ලෝමාවකට හෝ එක් සහතික පත්‍රයකට පමණක් සීමා වන පරිදි උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.) | <br>ලකුණු 03<br><br>ලකුණු 01 | 03 |
| 2.4. ක්ෂේත්‍රයට අදාළ වෘත්තීය සුදුසුකම්<br>2.4.1. උපාධිය<br>2.4.2. උසස් ඩිප්ලෝමාව<br>2.4.3. වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය<br>(එක් උපාධියකට හෝ එක් උසස් ඩිප්ලෝමාවකට හෝ එක් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වයකට පමණක් සීමා වන පරිදි උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.) | <br>ලකුණු 04<br>ලකුණු 03<br>ලකුණු 02 | 04 |
| 2.5. රැකියා ක්ෂේත්‍රයට අදාළ සේවාවන්හි පුහුණුවීම් වලට සහභාගී වීම<br>(එක් පුහුණුවකට ලකුණු 01 බැගින් උපරිම පුහුණු වැඩසටහන් 05ක් සඳහා ) | | 05 |
| 2.6. පොදු 230 'බී' ආකෘතිය යටතේ වන ප්‍රශංසා ලිපි<br>(එකක් සඳහා ලකුණු 01 බැගින් ප්‍රශංසා ලිපි පහක් සඳහා ) | | 05 |
| 2.7. රැකියා ක්ෂේත්‍රයට අදාළ ආයතන ගතව/ පළාත් වශයෙන් එළිදක්වන ලද නව නිර්මාණ<br>(ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුයි)<br>(එක් නව නිර්මාණයක් සඳහා ලකුණු 01 බැගින් නව නිර්මාණ පහක් සඳහා ) | | 05 |
| 2.8. ආසන්න වසර 05 ඇතුළත ඉටු කරන ලද විශේෂ ව්‍යාපෘති<br>(ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුයි)<br>(එක් විශේෂ ව්‍යාපෘතියක් සඳහා ලකුණු 01 බැගින් ව්‍යාපෘති පහක් සඳහා ) | | 05 |
| **03.** **සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය**<br>3.1. නායකත්වය - ලකුණු 02<br>3.2. සන්නිවේදන හැකියාව - ලකුණු 02<br>3.3. පෞරුෂත්වය - ලකුණු 01 | | 05 |